
# දඟමලී



ලිතුමි වර්න්‍යා කොඩිතුවක්කු

# දැලගමලී

කතෘ
## ලිතුමි චරින්යා කොඩිතුවක්කු

කතෘ : ලිතුමි චරින්යා කොඩිතුවක්කු
මහාමායා බාලිකා විදුහල
මහනුවර

ISBN No : 978-624-208-069-7
දිනය : 2023/11/15.

# පිදුම

මහාමායා බාලිකා විදුහලේ ගරු
විදුහල්පතිතුමියටත්,
පංතිභාර ගුරුතුමිය ඇතුළු
ආචාර්ය මණ්ඩලයටත්,
මෙම ව්‍යාපෘති නිර්මාපක
සෙනවිරත්න ගුරුතුමාටත්,
සැමදා මට දිරියක් වන මාගේ
දෙමාපියන්ටත්,
මාගේ යහළුවන්ටත්,
**මෙම පොත ආදරයෙන්**
**පුදමි..**

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාජෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයප්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය ක “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

ඈත ගමක ලස්සන ගෑනු ළමයෙක් හිටියා. එයාගේ නම සඳමලී. සඳමලී ලස්සන වගේම හරීම දඟයි. ගමේ ළමයි මෙයාට කැමති නැහැ. එයාගේ නම සඳමලී උනාට ගමේ ළමයි එයාට කීවේ **දඟමලී** කියලා.

හැමදාම වාගේ ගමේ කවුරුහරි එයා කරපු



මොනවාහරි හෝ නරක වැඩක් වැරැද්දක් ගැන එයාගේ අම්මාටයි තාත්තාටයි කියනවා.

අම්මාටයි තාත්තාටයි මේක හරිම වේදනාවක් වුනා. කොච්චර හොඳින් පහදලා දුන්නත් සඳමලී කියනදේ ඇහුවෙත් නෑ. හොඳ ළමයෙක් උනෙත් නෑ.

සඳමලීගේ අම්මයි තාත්තයි උදෑසනින් රැකියාවට ගිය පසු සඳමලී පාසලට යන්නේ ඇගේ අත්තම්මාත් එක්ක. වෙල දිගේ පාසලට යනකම් අත්තම්මා සඳමලී ට හොඳ අවවාද දෙමින් ඉගෙනීමේ වටිනාකම වගේම නරක ළමයෙක් නොවන්න කියා දුන්නත් සඳමලී එය අහගන ඉන්නෙත් නෑ. ගනන්ගත්තෙත් නෑ.

පාසල යන වේලාවටත් ඇය කරන්නේ සතුන්ට ගල් ගහන එකයි. ඒවාගේම පාසලේ ඉගෙනීමේ වැඩද සඳමලී කරන්නේ නැති නිසා පන්තිභාර ගුරුතුමියටත් ඇයව මහත් කරදරයක් වී තිබුණා.

## දිනක් සඳමලීගේ පංතිභාර

ගුරුතුමිය ඇයගේ දෙමාපියන් පංතිය වෙත ගෙන්වා සඳමලී හරි ආකාරව ඉගෙනුම් කටයුතු නොකරන බව දන්වා සිටියා. අනෙක් ළමයිටත් වැඩකර ගන්නට ඉඩ දෙන්නේ නැති බවද කියා තිබුණා. සඳමලී ගේ අම්මයි තාත්තයි මේ ගැන හරියට දුක් උනා.



සඳමලී කිසිම ගානක් තිබුනේ නෑ. අම්මයි තාත්තයි නිවසේ නැතිවිට අහල පහල ගෙවල් වල මල්පැළ ගලවා විසි කරනවා.



සමහර ගෙවල් වල මල් පෝච්චි එකකින් එකකට මාරු කලා.

කුඩුවල සිටින බල්ලන් පූසන්ගේ දොරවල් ඇරලා එයාලව එළියට දානවා.
හවස ගෙදර එන අම්මට තාත්තට පැමිණිලි ගොඩයි.

එක දවසක් එයාගේ ගෙදර ඇති කරන බලුපැටියගේ නැට්ටට ටින් එකක් ලණුවකින් ගැටගහලා. බල්ලා ඒ ටින් එකේ සද්දෙට ගම වටේට දුවලා. බල්ලා බයවෙලා කැලේට පැනලා.

මේ කතා ආරංචි වුනු තාත්තා සඳමලිට හොඳටම ගැහුවා. අම්මයි තාත්තයි කතා නොකරත් හිටියා.

තවත් දවසක ගෙදර අඹ ගහේ අත්ත උඩ තිබුණු කුරුළු කූඩුවක් පහළට ගන්න ගිහින් ඒකේ හිටපු කුරුළු පැටියා කූඩුවත් එක්කම බිමට වට්ටලා. ඒ කුරුළු අම්මයි තාත්තයි පැටියා ළඟ කෑගහනවා. කුරුළු පැටියත් හරිම අමාරුවෙන් කෑගහනවා.





ඔයා හැම නරක වැඩම කරලා සඳමලී පැත්තකට වෙලා හිනා වෙනවා. කුරුළු පැටියා වැටුන වෙලාවේ අම්මාට සද්දේ ඇහිලා කුස්සියේ ඉදන් දුවගන ආවා. අම්මා කුරුළු පැටියව අතට අරගෙන බලනකොට පැටියාගේ කකුල පිටිපස්සට නැමිලා කැඩිලා. කකුලට බෙහෙත් දාලා තාත්තට කියලා නැවතත් කූඩුවෙන් තිබ්බා.

තාත්තට හරිම කේන්තියි.

පාසල් වාර විභාගයෙත් හැමදාම වගේ අන්තිමයා උනා. එයාට ඒ ගැන ගානක් නැති උනාට අම්මා තාත්තා හරියටම දුක් උනා.

ඔහොම ඉන්න අතරතුර සඳමලීට හරි වැඩක් උනා. පුරුද්දට වගේ එදාත් පාරේ ගස් වල ගෙඩි කකා යනකොට එක ගෙදරක කුකුල් කොටුවක් දැක්කා. කූඩුවේ දොර ඇරලා කුකුල්ලු ඔක්කොම එලියට දාලා පන්නගන පාර දිගේ දිව්වා. මෙහෙම දුවනකොට ලිස්සලා වැටුනා.

ලෙස්සලා

වැටුන

සඳමලීට

ආපහු

නැගිටින්න

බැරි උනා.



සමහර යාළුවො ඒක දැකලා හිනා උනා. එයා හයියෙන් අඬන්න ගත්තා. කවුරුත් එයා ළඟට ආවේ නැහැ. එයා ගොඩක්වෙලා පාරේ අඬ අඬා හිටියා. නමුත් සමහර ළමයි සඳමලීගේ ගෙදර ගිහින් අත්තම්මාට කීවා. අත්තම්මා අතපය තුවාල වුන සඳමලීව ගෙදර එක්ක ගියා. සඳමලීට ඇවිදින්න බැරි වුනා. ඇවිදන් ගියේ අත්වාරුවෙන්.



අසනීපවෙලා ඇඳ උඩට වෙලා හිටපු දවස්වල එයා කරපු නපුරු වැඩ මතක් උනා. එයා හිරිහැර කරපු ළමයි එයාව බලන්න ආවා. සඳමලීට මතක් උනා එයා එදා බිමට දාපු කුරුළු පැටියා. එදා එයාට කොච්චර රිදෙන්න ඇතිද කියලා දුක් වුනා.

සඳමලීට එයා ගැනම ලැජ්ජා හිතුනා. අම්මා කියපු දේ ඇහුවේ නැති එකට අම්මාගෙන් සමාව ගත්තා. දෙමාපියන්ට කීකරු වුනා. පාසල් වැඩ හොඳින් කලා. සතුන්ට ආදරෙන් සැලකුවා. ලස්සනට මල් හිටවලා ගෙවත්තක් හැදුවා. සවසට බුදුන් වැඳලා බුදු සාදුට පහන තිබ්බා. අම්මට, තාත්තට, අත්තම්මාට උදව් කලා. එදා ඉදන් සඳමලී හොඳ ළමයෙක් උනා. ගෙදර හැමෝම එයාට ආදරේ කලා.

සඳමලී හැමෝටම උදව් කලා.

ඒ විතරක් නෙවෙයි එයාව හොයාන යාළුවොත් ගෙදර ආවා.

"දැඟමලී" කියපු හැමෝම එයාට "අපේ සඳමලී" කීවා.



නිමි



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලිකවඳ යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

“දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .


මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01


ISBN No : 978-624-208-069-7